විහාරමහාදේවි බාලිකා විද්‍යාලය - කිරිබත්ගොඩ

පළමු වාර පරීක්ෂණය- 2020

භූගෝල විද්‍යාව

7 ශ්‍රේණිය

I කොටස

සැලකිය යුතුයි.
ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
1 සිට 5 දක්වා ප්‍රශ්න වලට අදාළ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 පෘථිවිය පරිභ්‍රමණයට ගතවන කාලය

i පැය 24 කි. ii දින 365 යි පැය 6 කි. iii පැය 365 කි. iv දින 24 කි.

02 පෘථිවි පෘෂ්ඨය.

i ධ්‍රැවාසන්නයේදී පැතලිවේ. ii සමකාසන්නයේදී පැතලිවේ.

iii නිවර්තන වලදී පැතලිවේ. iv සෑම තැනකදීම පැතලිවේ.

03 ග්‍රිනිච් රේඛාවෙන් බටහිරට ඇත්තේ.

i නැගෙනහිර දේශාංශයයි. ii බටහිර අක්ෂාංශයයි.

iii බටහිර දේශාංශයයි. iv නැගෙනහිර අක්ෂාංශයයි.

04 පෘථිවි පෘෂ්ඨයෙන් වැඩි කොටසක් එනම් 71 % ඇත්තේ,

i මහද්වීප වේ. ii සාගර වේ . iii ගොඩබිම වේ. iv දූපත් වේ.

05 උතුරු අර්ධගෝලය හා දකුණු අර්ධගෝලය වෙන් කරන අක්ෂාංශය වන්නේ,

i මකර නිවර්තනය. ii සමකය.

iii කර්කටක නිවර්තනය iv ආක්ටික් වෘත්තය

අංක 6 - 10 දක්වා ඇති ප්‍රකාශ හරි නම් ( ) ලකුණද වැරදි නම් වැරදි ලකුණද ( ) ලකුණද ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.

06 ආදර්ශ පෘථිවි ගෝලයේ උතුරු දකුණු යා කරමින් ඇඳි රේඛා අක්ෂාංශයි. ( )

07 මැඩගස්කර දූපත ඇන්ටාටික් සාගරයේ පිහිටා ඇත. ( )

08 මහද්වීපවල දේශපාලනික වශයෙන් වෙන් වූ ප්‍රදේශ රටවල් වේ. ( )

09 පැසිපික් සාගරය විශාලම සාගරයවේ. ( )

10 ආසන්න වටපිටාව පදනම් කරගෙන නිරපේක්ෂ පිහිටීම දක්වයි. ( )

අංක 11 -15 දක්වා ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර දී ඇති වරහන් තුලින් තෝරා ලියන්න.

11 පෘථිවිය සූර්යා වටා ගමන් කිරීම ........................................................ නමින් හැඳින්වේ.

12 ශ්‍රී ලංකාව පිහිටා ඇත්තේ සමකයට ................................................ දිශාවෙනි.

13 ලෝකයේ ඇති ප්‍රධාන මහද්වීප ගණන ............................................ කි.

14 ඉන්දියන් සාගරයේ පිහිටි දූපතක් වන්නේ ........................................ යි.

15 ජාත්‍යන්තර දින රේඛාව විහිදෙන්නේ ...................................... දේශාංශය ඔස්සේය.

( පරභ්‍රමණය , උතුරු , භ්‍රමණය , හතකි , සිපේල්ස් , හයකි , දකුණු , 180° , නැගෙනහිර දේශාංශ 80° )

අංක 16 -20 දක්වා ප්‍රශ්න වලට A කොටසේ දැක්වෙන නියමයන්වලට ගැලපෙන පිළිතුර B කොටසින් සොයා යා කරන්න.

| A | B |
|---|---|
| 16 ආදර්ශගෝලයේ සිරස් අතට හරිම මැදින් වැටී ඇති රේඛාව. | හික්කඩුව |
| 17 විශාලම දූපත වේ. | ග්‍රිනිච් රේඛාව |
| 18 ශීත කලාපය තුළ පිහිටා ඇත. | සාගරය |
| 19 විශාලම ජලතලයක් වේ. | ග්‍රීන්ලන්තය |
| 20 ආකර්ශනය දිනාගත් ස්ථානයකි. | ඇන්ටාටිකාව |

( 20 × 2 )

page 2

## II කොටස

* පළමු ප්‍රශ්නය අනිවාර්යවේ.
* තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
* පිළිතුරු ලිවිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

01 පහත දැක්වෙන ලෝක සිතියම ඇසුරින් පිළිතුරු සපයන්න.

( i ) ' A ' අක්ෂරයෙන් දැක්වෙන රේඛාව .......................................... වේ.

( ii ) ' B ' අක්ෂරයෙන් දැක්වෙන දූපත .......................................... වේ.

( iii ) ' C ' අක්ෂරයෙන් දැක්වෙන .......................................... සාගරය වේ.

( iv) ' D ' අක්ෂරයෙන් දැක්වෙන .......................................... මහද්වීපයකි.

( v) ' E ' අක්ෂරයෙන් දැක්වෙන .......................................... මුහුද වේ.

( vi) ' F ' අක්ෂරයෙන් දැක්වෙන .......................................... සමුද්‍ර සන්ධියයි.

( ල . 12 )

02. ( i ) පෘථිවි භ්‍රමණය යන්න හදුන්වන්න.

( ල . 03 )

( ii ) එයට ගතවන කාලය හා එහි ප්‍රතිඵල දෙකක් ලියන්න.

( ල . 04 )

( iii ) පෘථිවිය පූර්ණ ගෝලයක් නොවේ ඊට හේතු ඉදිරිපත් කරන්න.

( ල . 05 )

03. ( i ) පෘථිවිය මත පිහිටි මහද්වීප ගණන කීයද?

( ල . 03 )

( ii ) විශාලම මහද්වීපය තුළ පිහිටි රටවල් 04 ක් ලියන්න.

( ල . 04 )

( iii ) මහද්වීප හා දූපත් යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

( ල . 05 )

04. ( i ) පෘථිවිය මතුපිට ප්‍රධාන සාගර කීයද ?

( ල . 03 )

( ii ) විශාලම සාගරය හා කුඩාම සාගරය නම් කරන්න.

( ල . 04 )

( iii ) මුහුද යන්න හඳුන්වා ඉන්දියන් සාගරයේ ඇති මුහුදු දෙකක් නම් කරන්න .

( ල . 05 )

05. ( i ) ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූ විෂමතා කලාප කීය ද ?

( ල . 03 )

( ii ) භූ විෂමතා කලාප 02 ක් නම් කරන්න.

( ල . 04 )

( iii ) වෙරළ ආශ්‍රිත භූ ලක්ෂණ 02 ක් ලියන්න.

( ල .'05 )

06. ( i ) ශ්‍රී ලංකාවේ වාර්ෂික උෂ්ණත්වය කීය ද ?


( ල . 03 )

( ii ) ශ්‍රී ලංකාවට වර්ෂාව ලැබෙන ප්‍රධාන ක්‍රම 02 ක් ලියන්න.

( ල . 04 )

( iii ) ශ්‍රී ලංකාවේ දැකිය හැකි වනාන්තර වර්ග මොනවාද ?

( ල . 05 )


N
B
C
A
E
F
D